# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 අප්‍රේල් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 1.75 තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 68/78

**මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම පිණිස ද එම යෝජනා ක්‍රමය ක්‍රියාමට නැගීමෙහි ලා සහාය වීම සඳහා සංස්ථා පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

## අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය

2. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන, (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යනුවෙන් හැඳින්වෙන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. මහවැලි අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය මගින් එයට පවරා දෙන ලද නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එහි සංස්ථා නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය. තව ද සංස්ථාව විසින් නීතිය අනුව ඉටු කරනු ලැබිය හැකි කටයුතු ඉටු කිරීම ද අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

3. (1) අමාත්‍යවරයාගේ මතය අනුව මහවැලි ගඟෙහි හෝ වෙනත් යම් ප්‍රධාන ගංගාවක ජල සම්පත්වලින් සංවර්ධනය කළ හැකි වන යම් ප්‍රදේශයක් (මෙහි මින් මතු "විශේෂ ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශේෂ ප්‍රදේශයක් විය යුතු යයි, අමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව කලින් කල ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ ප්‍රදේශයෙහි හෝ ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් ස්වකීය බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කිරීම ද ස්වකීය කර්තව්‍යයන් සියල්ලම හෝ ඉන් කිසිවක් කිරීම ද ස්වකීය කාර්ය සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කිරීම ද මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව කරනු ලැබිය හැකි ය. අධිකාරියෙහි විශේෂ ප්‍රදේශය.

(2) සෑම නියමයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් පාර්ලිමේන්තුව වෙත අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

1—ඊ 40107—11,900 (79/03)

(3) අධිකාරිය විසින් යම් කාර්යාලයක් හෝ ගබඩාවක් යම් විශේෂ ප්‍රදේශයකින් පිටත පවත්වාගෙන යාම හෝ මේ පනත යටතේ ස්වකීය කර්තව්‍යයන් කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් වැඩක් යම් විශේෂ ප්‍රදේශයකින් පිටත දී කිරීම හෝ ඉහතින් වූ උපවගන්තිවල සඳහන් කිසිවකින් වළක්වනු ලැබේ යයි නොසැලකිය යුතු ය.

අධිකාරියේ අධ්‍යක්ෂවරු.

4. අධිකාරිය අධ්‍යක්ෂවරයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු අතර ඔවුන්ගෙන්—

(අ) තිදෙනකු අමාත්‍යවරයා විසින්, ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, පත් කරනු ලැබිය යුතු ය.

(ආ) දෙදෙනකු නිල බලයෙන් සාමාජිකයන් විය යුතු ය. ඔවුන් දෙදෙනා—

(i) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ; සහ

(ii) මෙම පනත පරිපාලනය කිරීම භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා

විය යුතු ය.

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

5. (1) අමාත්‍යවරයා විසින්, ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂවරයන් අතුරින් එක් අධ්‍යක්ෂවරයකු අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ සෑම රැස්වීමක ම මූලාසනය දැරිය යුතු අතර, ඔහු පැමිණ නොසිටි අවස්ථාවක, ඒ රැස්වීමට පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් අධ්‍යක්ෂවරයකු විසින් ඒ රැස්වීමෙහි මූලාසනය දැරිය යුතු ය.

(4) අසනීප වීම, ශ්‍රී ලංකා ජනරජයෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයෙහි කාර්යයන් ඉටු කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවට ක්‍රියා කිරීම සඳහා යම් අධ්‍යක්ෂවරයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂවරුන්ගේ ධුර කාලය.

6. (1) මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කරතහොත් මිස, සෑම අධ්‍යක්ෂවරයකු ම ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු පහක කාලයක් ධුරය දැරිය යුතු ය.

(2) ලියවිල්ලකින් වූ සංදේශයක් අමාත්‍යවරයා වෙත යැවීමෙන් ඕනෑම අධ්‍යක්ෂවරයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) අධිකාරියෙහි පත් කරනු ලැබූ යම් අධ්‍යක්ෂවරයකු ධුර යෙන් ඉවත් කිරීම සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරතහොත්, ඒ සඳහා හේතු සඳහන් නොකර ඕහු විසින් ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඒ අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් (3) වන උපවගන්තිය යටතේ නියම යක් කරනු ලැබුවේ යම් අධ්‍යක්ෂවරයකු සම්බන්ධයෙන් ද ඒ අධ්‍යක්ෂවරයා, එම නියමය ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දිනයෙහි හෝ එම නියමයෙහි නිශ්චිතව සඳහන් වෙනත් යම් දිනයක හෝ ස්වකීය ධුරය හිස් කළ යුතු ය.

(5) ධුරයෙන් ඉවත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයකු අධිකාරියෙහි අධ්‍යක්ෂවරයකු ලෙස නැවත පත් කරනු ලැබීමට හෝ වෙනත් යම් තත්ත්වයකින් අධිකාරියට සේවය කිරීමට හෝ සුදුසු නොවිය යුතු ය.

(6) යම් අධ්‍යක්ෂවරයකු ධුරය හිස් කළ කල්හි එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය. එම තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වූයේ යම් අධ්‍යක්ෂ වරයකුට ද ඒ ඒ අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ගත නොවී ඇති කාල සීමාව තුළ ධුරය දැරිය යුතු ය.

(7) අසනීප වීම, ශ්‍රී ලංකා ජනරජයෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයෙහි කාර්යයන් ඉටු කිරීමට යම් අධ්‍යක්ෂවරයකුට තාවකාලිකව නොහැකි වන අවස් ථාවක, ඒ අධ්‍යක්ෂවරයා වෙනුවට ක්‍රියා කිරීම සඳහා යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ වරයකු ලෙස පත් කිරීම සඳහා නුසුදුසුකම්.

7. යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තුවෙහි මන්ත්‍රීවරයෙක් හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙක් නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් යයි තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශිතව ඇත් නම්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත්වූවකු ලෙස හෝ බංකොලොත්වූවකු ලෙස ප්‍රකාශිතව, නිදහස් කරනු නොලැබූ, වස්තු භංගත්වයට පත්වූවකු හෝ බංකොලොත්වූවකු වන තැනැත්තෙක් නම්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටිසි නම් හෝ යටත්ව සිටියේ නම්,

අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ එලෙස තවදුර ටත් කටයුතු කිරීම සඳහා හෝ ඔහු සුදුසු නොවිය යුතු ය.

අධ්‍යක්ෂ වරයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන්, ක්‍රියා හෝ කටයුතු බලරහිත නොවන බව.

8. අධිකාරියේ අධ්‍යක්ෂවරයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි අධ්‍යක්ෂවරයන්ගෙන් කිසිවකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හුදු හේතුව නිසාම අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

අධ්‍යක්ෂ වරයන්ගේ පාරිශ්‍රමික සහ සේවා නියම හා සේවා කොන්දේසි.

9. අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කරනු ලබන අනුපාතික අනුව සහ එසේ තීරණය කරනු ලබන ආකාරයට අධිකාරියේ අධ්‍යක්ෂවරයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, එසේ තීරණය කරනු ලබන සේවා නියමයන්ට සහ සේවා කොන්දේසි වලට ඔවුන් යටත් විය යුතු ය.

අධිකාරියේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල ගණ පූරණය.

10. (1) අධිකාරියේ රැස්වීම් සහ එම රැස්වීම්වල කටයුතු පවත්වා ගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව, අධිකාරිය විසින් විධිමත් කරගනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය අන් ලෙසකින් තීරණය කළහොත් මිස, අධිකාරියෙහි රැස්වීමක් සඳහා ගණපූරණය සඳහා සාමාජිකයන් තුන් දෙනකු සිටිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

11. (1) අධිකාරියේ මුද්‍රාව, අධිකාරිය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තාගේ භාරයෙහි තිබිය යුතු ය.

(2) අධිකාරියේ මුද්‍රාව, අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ වෙනත් එක් අධ්‍යක්ෂවරයකු ඉදිරිපිට දී හැර අධිකාරියෙහි මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ම එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව තබන වේලාවේ දී පැමිණ සිටීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නොහැකි වන අවස්ථාවක, මේ උපවගන්තියෙහි ඉහත දැක්වෙන විධිවිධානවලට අනුකූලව එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරන ලද වෙන යම් අධ්‍යක්ෂවරයකුට බලය තිබිය යුතු ය.

(4) අධිකාරියෙහි මුද්‍රාව තබනු ලබන සාධන පත්‍රවල හෝ ලේඛන වල ලේඛනයක් අධිකාරිය විසින් පවත්වා ගෙන යා යුතු ය.

## බලතල හා කර්තව්‍ය

12. යම් විශේෂ ප්‍රදේශයක හෝ විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත දැක්වෙන කර්තව්‍ය විය යුතු ය:— අධිකාරියේ කර්තව්‍ය.

(අ) ජලාශ, වාරිමාර්ග බෙදා හැරීමේ ක්‍රම සහ විදුලි බලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යන්ත්‍රස්ථාන ඉදි කිරීම සහ මෙහෙය වීම ඇතුළු, මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැගීම:

එසේ වුව ද, විදුලි බලය බෙදා හැරීමට අදාළ කර්තව්‍යය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් ද කරනු ලැබිය හැකි ය;

(ආ) යම් විශේෂ ප්‍රදේශයක පූර්ණ සහ ඒකාග්‍ර සංවර්ධනයට ප්‍රතිෂ්ඨාධාරවීම සහ ඒ සංවර්ධනය සුරක්ෂිත කිරීම;

(ඇ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ කෘෂිකාර්මික පලදාවර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් උපරිම තත්ත්වයට පත් කිරීම සහ ආර්ථික සහ කෘෂිකාර්මික සංවර්ධනය ඇති කිරීම සහ ඒ සංවර්ධනය සුරක්ෂිත කිරීම;

(ඈ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ භෞතික පරිසරය සංරක්ෂණය කිරීම සහ එය පවත්වාගෙන යාම;

(ඉ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ ජනතාවගේ පොදු සුබසාධනය සහ සංස්කෘතික ප්‍රගතිය දියුණු කරලීම සහ එම ප්‍රදේශයේ කටයුතු පරිපාලනය කිරීම;

(ඊ) අභ්‍යන්තර වූ සහ බාහිර වූ උභය පෞද්ගලික ප්‍රාග්ධනය යම් විශේෂ ප්‍රදේශයක ආර්ථික සහ කෘෂිකාර්මික සංවර්ධනයෙහි යෙදවීම නංවාලීම සහ සුරක්ෂිත කිරීම; සහ

(උ) මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීමෙහි සහ ක්‍රියාවට නැගීමෙහි දී ද යම් විශේෂ ප්‍රදේශයක් සංවර්ධනය කිරීමෙහි දී ද ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය ආයතනවල, පළාත් පාලන ආයතනවල, රජයේ සංස්ථාවල සහ පෞද්ගලික හෝ රජයේ වූ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ එය සුරක්ෂිත කිරීම.

13. වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද එය නොතකා ද, මේ පනතින් අධිකාරිය වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව ද, යම් විශේෂ ප්‍රදේශයක හෝ යම් විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන්, පහත දැක්වෙන බලය අධිකාරියට තිබිය යුතු ය:— අධිකාරියේ බලතල.

(1) අධිකාරියෙහි පරමාර්ථ ඉෂ්ට කර ගැනීමේ කාර්යය සඳහා වේලි, ඇළවල්, ජලාපවහන ක්‍රම සහ වෙනත් වාරි කර්මාන්ත සහ ව්‍යුහ ඉදි කිරීමට, නඩත්තු කිරීමට සහ මෙහෙයවීමට;

(2) විදුලි බලය නිපදවීමේ සහ සැපයීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි ජල විදුලි බල යන්ත්‍රස්ථාන ඉදි කිරීමට :

එසේ වුව ද, විදුලි බල බෙදා හැරීමට අදාළ කර්තව්‍යය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් අධිකාරියක් විසින් ද කරනු ලැබිය හැකි ය ;

(3) දිය බෙත්ම කළමනාකරණය කිරීමට සහ පස සේදී යාම පාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි පියවර ගැනීමට ;

(4) යම් විශේෂ ප්‍රදේශයක ඉඩම්වල, ගොවිපලවල සහ දේපළවල පදිංචිවීම දියුණු කිරීමට, ඊට සහාය වීමට හා එය සුරක්ෂිත කිරීමට සහ ඒ ඉඩම්වල, ගොවිපලවල සහ දේපළවල පදිංචි වන්නා වූ හෝ ගොවිතැන් කරන්නා වූ නැතහොත් වෙනත් ආකාරයකින් ඒවා සංවර්ධනය කරන්නා වූ හෝ එසේ කිරීමට අභිලාෂය දක්වන්නා වූ තැනැත්තන්ගේ වියදම් සඳහා කලින් මුදල් දීමට සහ ඒ වියදම් ගෙවීමට හෝ ඒ වියදම්වලට දායකවීමට නැතහොත් අන්‍යාකාරය කින් සහාය වීමට සහ ඒ සඳහා අවශ්‍ය වන්නා වූ හෝ ඊට සම්බන්ධ වූ සියලු පියවර ගැනීමට ;

(5) ගොවිපලවල් කළමනාකරණය කිරීමට සහ සෑම ආකාරයක ම ගොවිතැන්වල හා කෘෂිකාර්මික හා උද්‍යාන විද්‍යා කටයුතු වල නිරත වීමට ;

(6) සියලු ඉඩම් හෝ ඉන් යම් කොටසක් හෝ කළමනාකරණය කිරීමට, වැඩි දියුණු කිරීමට, ගොවිතැන් කිරීමට, වගා කිරීමට, නඩත්තු කිරීමට, බදු දීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් කටයුතු කිරීමට ;

(7) වගා කිරීමේ ක්‍රම, ජලය පාලනය කිරීම, පස පාලනය කිරීම සහ භෞතික පරිසරය ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම සඳහා උපදේශක සේවා සහ ගොවීන් පුහුණු කිරීමේ සේවා සැලසීමට ;

(8) ගොවි පවුල් සමාජ විසින් සකස් කරන ලද කෘෂිකාර්මික සැලසුම් ක්‍රියාවට නැඟීමෙහි ලා සහාය වීමට ;

(9) ගොවියනට අධීක්ෂිත ණය යෝජනා ක්‍රමයක් කළමනාකර ණය කිරීමට සහ මෙහෙයවීමට ;

(10) ගොවියනට සහ වෙනත් තැනැත්තන්ට බීජ ද්‍රව්‍ය, පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, විදුලි බලය, කෘෂිකාර්මික යන්ත්‍රෝප කරණ සහ මෙවලම් සපයා දීමට ;

(11) කෘෂිකර්මය සහ කෘෂිමූලික නැතහොත් ඊට සම්බන්ධ වූ කර්මාන්තවල සංවර්ධනයට අදාළ පර්යේෂණ පවත්වා ගෙන යෑමට ;

(12) කෘෂිමූලික නැතහොත් ඒවාට සම්බන්ධ වූ කාර්මික හෝ වාණිජ ව්‍යවසායක් නංවාලීමට, කරගෙන යාමට සහ ඊට සහභාගි වීමට ;

(13) ගොවිපලවල නිෂ්පාදන සහ වෙනත් නිෂ්පාදන සම්බන්ධයෙන් සෙස් බදු අය කිරීමට සහ අධිකාරිය විසින් සපයනු ලබන ජලය සඳහා හෝ සලසනු ලබන යම් සේවයක් සඳහා අය කිරීමක් හෝ ගාස්තුවක් පැනවීමට ;

(14) ගොවිපලවල නිෂ්පාදන සහ වෙනත් නිෂ්පාදන මිලට ගැනීම, ගබඩා කිරීම, සකස් කිරීම සහ විකිණීම සඳහා අලෙවි සේවා සැලසීමට ;

(15) යම් වර්ගයක යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ, මෙවලම්, භාණ්ඩ හෝ දේවල් කිසිවක් නිෂ්පාදනය කිරීමට, මිලට ගැනීමට, විකිණීමේ සහ ඒවා සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් කටයුතු කිරීමට ;

(16) කාර්යාල, කම්මල්, යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ සහ වෙනත් දේවල් කිසිවක් මිලට ගැනීමට නැතහොත් අන් ලෙසකින් අත්කර ගැනීමට, ඉදි කිරීමට, නඩත්තු කිරීමට, ප්‍රතිසංස්කරණය කිරීමට සහ අනුවර්තනය කිරීමට ;

(17) භාණ්ඩ, නිෂ්පාදන, ද්‍රව්‍ය, සහ වෙළෙඳ ද්‍රව්‍ය ආනයනය කිරීමට, අපනයනය කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ ඒවා සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් කටයුතු කිරීමට ;

(18) අධිකාරියෙහි අරමුණු නංවාලීමට හෝ වර්ධනය කිරීමට ඉඩ ඇති, යම් සමාගමක, සමිතියක හෝ ව්‍යාපාරයක කොටස්වලට හෝ ස්කන්ධවලට දායකවීමෙන්, ඒවා මිලට ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අත්කර ගැනීමට, පිළිගැනීමට, ගැනීමට, දැරීමට සහ විකිණීමට ;

(19) ඉටු කරන ලද යම් සේවයන් සඳහා ගෙවීමක් හෝ කොටසක් ගෙවීමක් වශයෙන් හෝ යම් සමාගමකට කරන ලද යම් විකිණීමක් සඳහා හෝ එයින් යම් සමාගමකින් ලැබිය යුතු ණයක් වෙනුවෙන් හෝ එයින් යම් සමාගමක ස්කන්ධ සහ කොටස් හෝ ණය පත්‍ර, උකස් ණය පත්‍ර හෝ වෙනත් ඇපකර පිළිගැනීමට ;

(20) ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයක් තිබෙන පාලිත සමාගම් නංවාලීමට, ඒවායේ ආයෝජනය කිරීමට, සහ ඒවාට සහභාගි වීමට ;

(21) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධිකාරිය විසින් ප්‍රමුඛත්වය පිළිබඳ හෝ අන්‍යාකාර නියමයන් මත තීරණය කරනු ලැබිය හැකි ණය පත්‍ර, ණය ස්කන්ධ, බැඳුම්කර, උකස් හෝ වෙනත් යම් ඇපකර නිකුත් කිරීමෙන් හෝ කිසිම ඇපයක් නැතිව හෝ ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රභවයන්ගෙන්, මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට සහ බැදීම් ඇතිකර ගැනීමට ;

(22) තැන්පත් මුදල මත පොලී සඳහා ඉඩ තැබීමක් ඇතිව හෝ නැතිව, තැන්පත් මුදල් භාර ගැනීමට ;

(23) ප්‍රමාණවත් විය හැකි ඇප ඇතිව හෝ කිසිම ඇපයක් ලබා නොගෙන හෝ මුදල් අත්තිකාරම් වශයෙන් දීමට හෝ ණයට දීමට ;

(24) අධිකාරිය විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට අධිකාරියේ මුදල් ආයෝජනය කිරීමට ;

(25) විනිමය බිල්පත් සහ පොරොන්දු නෝට්ටු ද වෙනත් ගනුදෙනු කල හැකි සාධන පත්‍ර ද ලිවීමට, භාර ගැනීමට සහ සෑදීමට, සහ ඒවා පිටසන් කිරීමට, වට්ටම් කිරීමට සහ ගනුදෙනු කිරීමට ;

(26) යම් සමාගමක හෝ සංගමයක කොටස්, සෘණ පත්‍ර, සෘණ ස්කන්ධ හෝ වෙනත් ඇපකර නැතහොත් බැඳීම් නිකුත් කිරීමට හෝ නිකුත් කිරීම සහතික කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් පොලී ගෙවීමට සහ එවැනි යම් නිකුත් කිරීමක් සම්බන්ධයෙන් බ්‍රෝකර් ගාස්තු, කොමිස් මුදල් සහ රක්ෂණය සඳහා ගෙවීම් කිරීමට හෝ ප්‍රතිපාදන සැලසීමට ;

(27) යම් ආණ්ඩුවේ හෝ වෙනත් අධිකාරියක් සඳහා හෝ පෞද්ගලික හෝ පොදු මණ්ඩල සහ වෙනත් තැනැත්තන් සඳහා හෝ අනුයෝජිතයන් වශයෙන් ක්‍රියා කිරීමට ;

(28) අධිකාරියේ අරමුණුවලට අදාළ නංවාලීමේ සහ ප්‍රචාරක කටයුතු භාර ගැනීමට ;

(29) යම් විශේෂ ප්‍රදේශයක සියලුම වර්ගවල ක්‍රීඩා, විනෝද කටයුතු, විනෝද සැපයුම් නංවාලීමට, සංවිධානය කිරීමට සහ කළමනාකරණය කිරීමට සහ විනෝද කටයුතු සහ වෙනත් විවේක කාල යෙදවීම් සඳහා විධිවිධාන සැලසීමට ;

(30) යම් විශේෂ ප්‍රදේශයක තැනැත්තන් අතර දරිද්‍රතා සහන, පීඩා සහන සහ ව්‍යසන සහන සඳහා විධිවිධාන සැලසීමට ;

(31) යම් විශේෂ ප්‍රදේශයක් ඇතුලත පොදු ස්වභාවයක වූ යම් පුණ්‍ය, යහසාධක නැතහොත් ප්‍රයෝජනවත් අරමුණකට සහභාගි වීමට හෝ දායක වීමට ;

(32) අධිකාරියේ කර්තව්‍යයන් කර ගෙන යෑම සඳහා අවශ්‍ය වන සේවා නියුක්තයන් සහ අනුයෝජිතයන් පත් කිරීමට ;

(33) අධිකාරියෙහි සේවයේ නියුක්තව සිටින හෝ අධිකාරියෙහි කලින් සේවයේ නියුක්තව සිටි තැනැත්තන්ගේ සහ එම තැනැත්තන්ගේ භාර්යාවන්ගේ, යැන්දඹුවන්ගේ සහ පවුල්වල සුභ සිද්ධිය සඳහා මුදල්, විශ්‍රාම වැටුප් හෝ වෙනත් ගෙවීම් ප්‍රදානය කිරීම් මගින් විධිවිධාන සැලැස්වීමට සහ යම් විශේෂ ප්‍රදේශයක යහසාධක, ආගමික, විද්‍යාත්මක හෝ ජාතික ආයතන පිහිටුවීමට, ඒවාට දායක වීමට හෝ අන්‍යාකාරයකින් ආධාර කිරීමට ;

(34) යම් විශේෂ ප්‍රදේශයක ප්‍රජාවගේ පොදු සුභ සිද්ධිය සඳහා අවශ්‍ය වන සියලු පියවර ගැනීමට ;

(35) අනුයෝජිතයන් හෝ භාරකරුවන් ලෙස හෝ අන්‍යාකාරයෙන් ද, තනිව හෝ අන්‍යයන් සමග සම්බන්ධව ද අධිකාරියේ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමට ; සහ

(36) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට, කාර්යයන් ඉටු කිරීමට සහ කර්තව්‍යයන් කිරීමට ආනුෂංගික වන්නා වූ හෝ අනුයායී වන්නා වූ හෝ සම්බන්ධ වන්නා වූ වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීමට.

අධිකාරියේ දෙපාර්තමේන්තු සහ අනුයෝජිත ආයතන.

14. (1) අධිකාරියෙහි කර්තව්‍යයන් කිරීමෙහි ලා අදාළ වන යම් වැඩක කාර්යය සඳහා අධිකාරියේ ම දෙපාර්තමේන්තු හෝ අනුයෝජිත ආයතන පිහිටුවා ගැනීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

(2) ස්වකීය කර්තව්‍යයන් කරගෙන යෑම සඳහා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, පොදු සංස්ථා සහ පෞද්ගලික වූ හෝ පොදු වූ වෙනත් මණ්ඩල සමග වැඩ පිළිවෙලවල් හෝ ගිවිසුම් ඇතිකර ගැනීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

අධිකාරිය වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී ක්‍රියා කිරීමට තැනැත්තන්ට බලය දීම.

15. අධිකාරිය සඳහා හෝ වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක දී සාමාන්‍යයෙන් හෝ යම් නිශ්චිත කාරණාවක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම පිණිස, අධිකාරිය විසින්, ස්වකීය මුද්‍රාව යටතේ වූ ලියවිල්ලකින් යම් තැනැත්තකුට බලය දිය හැකි ය.

අධිකාරියේ බලතල යනාදිය පැවරීම.

16. (1) අධිකාරිය වෙත පිරිනමා ඇති යම් බලයක් හෝ නියම කර ඇති යම් කාර්යයක් හෝ පවරා දී ඇති යම් කර්තව්‍යයක් ලියවිල්ලකින් නිශ්චය කරනු ලබන කොන්දේසිවලට යටත් ව අධිකාරිය විසින් යම් අධ්‍යක්ෂවරයකුට හෝ අධිකාරියෙහි යම් දෙපාර්තමේන්තුවක යම් ප්‍රධානයකුට හෝ පවරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් පැවරීමක් කර තිබුණ ද, යම් බලයක් ක්‍රියාත්මක කිරීම, යම් කාර්යයක් ඉටු කිරීම හෝ යම් කර්තව්‍යයක් කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

17. (1) අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන සේවා නියුක්තයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ කාර්ය මණ්ඩලය පත් කිරීම, ඔවුන් සේවයෙන් පහකිරීම සහ එම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම ද, එම කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන, හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ද, එම කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් සහ සේවා කොන්දේසි තීරණය කිරීම ද අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

අධිකාරියට රජයේ නිලධරයන් පත් කිරීම.

18. (1) අධිකාරියේ ඉල්ලීම පිට, යම් රජයේ නිලධරයකු ඒ නිලධරයාගේ කැමැත්ත සහ එම නිලධරයා පත් කිරීමට තත් කාලයෙහි බලය දරන තැනැත්තාගේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන

කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) රජයේ නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතෙහි 26 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදය හැර 26 වන වගන්තියෙහි (3) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(ආ) රජයේ නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ පනතේ 26 වන වගන්තියෙහි (4) වන සහ (5) වන උපවගන්ති ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

යම් කාර්යයක් සඳහා දෙන ලද මුදල් ආධාර ඒ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා බව අධිකාරිය විසින් නිසැක කර ගත යුතු බව.

19. යම් කෘෂිකාර්මික, කාර්මික හෝ වාණිජ ව්‍යවසායකට අධිකාරිය විසින් දෙන ලද යම් මුදල් ආධාරයක්, එය දෙනු ලැබුවේ යම් කාර්යයක් සඳහා ද, එම කාර්යය සඳහා ප්‍රයෝජනයට ගනු ලබන බව නිසැක කර ගැනීම සඳහා අවශ්‍ය වන සියලු පියවර අධිකාරිය විසින් ගත යුතු ය.

අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවහොත් මිස, අධ්‍යක්ෂවරයකුට සම්බන්ධතාවක් ඇති ව්‍යවසායක් සමග අධිකාරිය ගනුදෙනු නොකළ යුතු බව.

20. අධිකාරියේ අධ්‍යක්ෂවරයකු හවුල්කරුවකු වන, අධ්‍යක්ෂවරයකු වන හෝ කොටස්කරුවකු වන නැතහොත් වෙනත් යම් ආකාරයකට කෙලින් ම හෝ නො එසේ ව ඔහුට සම්බන්ධතාවක් ඇති යම් ව්‍යවසායක ආයෝජනයක් කිරීම හෝ ඒ ව්‍යවසාය සමග අන්‍යාකාරයකින් ගනුදෙනු කිරීම, අමාත්‍යවරයා විසින් එම ගනුදෙනුව අනුමත කර ඇත්නම් මිස, අධිකාරිය විසින් නො කළ යුතු ය.

ඇතැම් දෙපාර්තමේන්තු සහ සංස්ථා සම්බන්ධයෙන් අධිකාරියේ විශේෂ බලතල.

21. (1) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද—

(අ) අධිකාරිය විසින් තීරණය කරනු ලබන කර්තව්‍යයක් හෝ කාර්යයක් ඉටු කරන ලෙස නියම කරමින්, මේ පනතේ "අ" උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් දෙපාර්තමේන්තු සහ සංස්ථා අතුරින් කිසිවකට අධිකාරිය විසින් විශේෂ හෝ පොදු විධාන කිරීම, මේ පනතේ කාර්යයන් සඳහා ඒ දෙපාර්තමේන්තුවට හෝ සංස්ථාවට එසේ විධාන කිරීම අවශ්‍ය යයි අධිකාරිය සලකන අවස්ථාවල අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය; තවද

(ආ) එයින් යම් විධානයක් කරනු ලැබුවේ යම් දෙපාර්තමේන්තුවකට ද නැතහොත් සංස්ථාවකට ද එම දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව විසින් ඒ විධානයට අනුකූලව ක්‍රියා කිරීම නිත්‍යානුකූල විය යුතු ය; තවද

(ඇ) එයින් යම් විධානයක් කරනු ලැබුවේ යම් දෙපාර්තමේන්තුවකට ද නැතහොත් සංස්ථාවකට ද එම දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව විසින් ඒ විධානයට අනුකූලව ක්‍රියා කළ යුතු ය; තවද

(ඈ) එයින් යම් විධානයක් කරනු ලැබුවේ යම් දෙපාර්තමේන්තුවකට ද නැතහොත් සංස්ථාවකට ද එම දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව එම විධානයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් අධිකාරියෙහි අධීක්ෂණයට සහ පාලනයට යටත් විය යුතු ය.

(2) අධිකාරියේ කර්තව්‍යයන් කාර්යක්ෂමව කිරීම සඳහා මෙහි "අ" උපලේඛනය සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අන්‍යාකාර කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් ඔහු විසින් ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, එසේ කරනු ලැබිය හැකි ය.

විශේෂ ප්‍රදේශයක් විෂයයෙහි අධිකාරියේ විශේෂ බලතල.

22. (1) මෙහි "ආ" උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තත් කාලයේ ලිඛිත නීති, එයින් යම් ලිඛිත නීතියකින් යම් අධිකාරියක්, නිලධරයකු හෝ තැනැත්තකු වෙත පැවරී ඇති බලතල අතුරින් කිසිවක් ක්‍රියාත්මක කිරීමට හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් කිරීමට හෝ බලය පවරන ලද ඒ අධිකාරිය, නිලධරයා නැතහොත් තැනැත්තා පිළිබඳ සඳහන් කිරීමකට අධිකාරිය පිළිබඳ සඳහන් කිරීමක් ද ඇතුළත්ව ඇත්තාක් මෙන් අධිකාරිය විසින් ඒ ප්‍රදේශයෙහි, ඒ බලතල අතුරින් කිසිවක් ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍යයන් අතුරින් කිසිවක් කිරීම හෝ නිත්‍යානුකූලය යන මඳ වෙනස් කිරීමට යටත්ව, සෑම විශේෂ ප්‍රදේශයක ම බලපැවැත්විය යුතු ය.

(2) මෙහි "ආ" උපලේඛනයෙහි තත් කාලයෙහි නිශ්චිතව සඳහන් යම් ලිඛිත නීතියක් මගින් බලතල හෝ කාර්යයන් කිසිවක් පැවරී ඇති කිසිම අධිකාරියක් විසින්, නිලධරයකු විසින් හෝ තැනැත්තකු විසින්, 14 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් ඇති කර ගන්නා ලද යම් වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යෙදවීමේ නැතහොත් ගිවිසුමක් ඉටු කිරීමේ කාර්ය සඳහා හැර, විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන් එවැනි බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය කිසිවක් කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

(3) ක්‍රියාත්මක කිරීමට හෝ කිරීමට (1) වන උපවගන්තියෙන් අධිකාරියට බලය පවරා ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම හෝ යම් කර්තව්‍යයක් කිරීම අධිකාරිය විසින් ඒ සඳහා බලය පවරන ලද අධිකාරියේ යම් අධ්‍යක්ෂවරයකු විසින් හෝ අධිකාරියේ යම් සේවා නියුක්තයකු විසින් හෝ අධිකාරිය වෙනුවෙන් කරනු ලැබිය හැකි ය.

(4) අධිකාරියේ කර්තව්‍යයන් කාර්යක්ෂමව කිරීම සඳහා මෙහි "ආ" උපලේඛනය සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අන්‍යාකාර කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඔහු විසින් අදාළ අමාත්‍යවරයාගේ එකඟත්වය සහ ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, එසේ කරනු ලැබිය හැකි ය.

අධිකාරිය සඳහා යම් විශේෂ ප්‍රදේශයක ඉඩම් අනිවාර්ය යෙන් අත්කර ගැනීම.

23. (1) යම් විශේෂ ප්‍රදේශයක ඉඩමක් හෝ යම් ඉඩමක් පිළිබඳ යම් සම්බන්ධතාවක් අධිකාරියෙහි කාර්යයන්ගෙන් කිසිවක් සඳහා අධිකාරියට අවශ්‍ය වූ අවස්ථාවක, ඒ ඉඩම හෝ සම්බන්ධතාව අධිකාරිය සඳහා ආණ්ඩුව විසින් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි ය. (2) වන උපවගන්තියෙහි වෙනත් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, ඒ ඉඩම හෝ සම්බන්ධතාව අත්කර ගැනීමේ කාර්යය සඳහා ඒ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) අධිකාරියේ යම් කාර්යයක් සඳහා යම් විශේෂ ප්‍රදේශයක යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබීමට ඇත්තා වූ ද ඒ ඉඩම හෝ සම්බන්ධතාව අත්කර ගැනීමේ අභිප්‍රාය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම, එම විශේෂ ප්‍රදේශය ප්‍රකාශ කරන නියමය 4 (1) වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ දිනයෙන් ආරම්භ වන අවුරුදු තුනක් ඇතුළත යම් වේලාවක ඒ පනතින් නියමිත පරිදි පළ කර ඇත්තා වූ ද යම් අවස්ථාවක, ඒ ඉඩම හෝ සම්බන්ධතාව සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි ප්‍රමාණය තීරණය කිරීමේ කාර්ය සඳහා පහත දැක්වෙන විධිවිධාන, ඒ පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, අදාළ විය යුතු ය :—

(අ) අත්කර ගන්නා අවස්ථාවෙහි ඉඩමෙහි තිබුණු තත්වය ම, එම නියමය කරන ලද දිනයෙහි ද තිබුණි නම්, ඒ දිනයෙන් පසු සද්භාවයෙන් කරන ලද වැඩි දියුණුකිරීම් කිසිවක් ඇත්නම් ඒ වෙනුවෙන් සාධාරණ මුදලක් එකතු කරනු ලැබූ, එම නියමය කරන ලද දිනයෙහි තිබුණු, ඉඩමෙහි වෙළෙඳ වටිනාකම, එම ඉඩමෙහි වෙළෙඳ වටිනාකම ලෙස සැලකිය යුතු ය;

(ආ) එම නියමය කරන ලද දිනයෙහි ඉඩමෙහි වෙළෙඳ වටිනාකම නිසැකව දැන ගැනීමේ දී මේ පනත ක්‍රියාත්මක කිරීමෙහි ලා අධිකාරියෙහි යම් සංවර්ධන කටයුත්තකින් නැතහොත් වෙනත් ක්‍රියාවලියකින් කෙළින් ම හෝ නොඑසේව ලැබුණු වටිනාකමෙහි යම් ප්‍රතිලාභයක් නැතහොත් වැඩිවීමක් හෝ ලැබීමට ඉඩ ඇති වටිනාකමෙහි යම් ප්‍රතිලාභ නැතහොත් වැඩිවීම් අපේක්ෂාවක් හෝ ගණන් ගැනීම නොකළ යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ හැර අන් ලෙසකින් යම් විශේෂ ප්‍රදේශයක ඉඩම්වල සන්තකය ඇරීම.

24. (1) අධිකාරිය විසින් (2) වන උපවගන්තියෙහි විධිවිධානවලට අනුකූලව පළකර ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මගින්, විශේෂ ප්‍රදේශයක, එම දැන්වීමෙහි විස්තර කර ඇති කොටසක පිහිටි යම් ඉඩමකට හෝ ඉඩමක් සම්බන්ධයෙන් හෝ යම් අයිතිවාසිකමකට, හිමිකමකට හෝ සම්බන්ධතාවකට හිමිකම් පාන සෑම තැනැත්තකුට ම එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කාලය ඇතුළත ස්වකීය හිමිකම් පෑම ලියවිල්ලකින් අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම, ගැසට් පත්‍රයෙහි ද යටත් පිරිසෙයින් සිංහල භාෂාවෙන් වූ එක් ප්‍රවෘත්ති පත්‍රයක සහ දෙමළ භාෂාවෙන් වූ එක් ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කරනු ලැබිය යුතු ය. තව ද එය ඒ විශේෂ ප්‍රදේශයෙහි, ඒ දැන්වීමේ විස්තර කර ඇති කොටසේ ප්‍රකටව පෙනෙන ස්ථානවල අධිකාරියේ විධානවලට අනුකූලව ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන යටතේ පළකර ප්‍රදර්ශනය කරන ලද දැන්වීමක විස්තර කරන ලද විශේෂ ප්‍රදේශයක එසේ විස්තර කරන ලද කොටසක පිහිටා ඇති යම් ඉඩමක් අධිකාරියේ කාර්යයන් සඳහා අධිකාරියට අවශ්‍ය වන කල්හි, ඒ දැන්වීමෙන් නියමිත පරිදි, ඒ ඉඩමට හෝ ඉඩම සම්බන්ධයෙන් යම් අයිතිවාසිකමකට, හිමිකමකට හෝ සම්බන්ධතාවකට කිසිදු හිමිකම් පෑමක් අධිකාරිය වෙත කර නොමැත්තා වූ හෝ ඒ ඉඩම සම්බන්ධයෙන් කරන ලද සියලු හිමිකම් පෑම් නිසි විමර්ශනයකින් පසුව බල රහිත ලෙස අධිකාරිය විසින් සලකනු ලබන්නා වූ අවස්ථාවක, ඒ ඉඩම සම්බන්ධයෙන් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ කටයුතු කිසිවක් කර නොතිබුණ ද, අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ඒ ඉඩම සන්තකයට ගෙන ඒ ඉඩම මත යම් වැඩක් කිරීමට සැලැස්විය හැකි ය.

(4) අධිකාරිය විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් (3) වන උපවගන්තියෙහි සඳහන් යම් ඉඩමක සන්තකය අධිකාරිය සඳහා සහ වෙනුවෙන් ලබාගනු ලැබිය හැකි ය.

(5) (3) වන උපවගන්තියෙහි සඳහන් යම් ඉඩමක සන්තකය ලබා ගැනීමට අධිකාරිය විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට කරන ලද යම් බාධා කිරීමක් හෝ අවහිර කිරීමක් නිසා ඒ ඉඩමෙහි සන්තකය ලබා ගැනීමට ඔහුට නොහැකි වන අවස්ථාවක, ඒ ඉඩම පිහිටා ඇත්තේ යම් අධිකරණ බල ප්‍රදේශයක ද ඒ ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඔහු විසින් ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට, අධිකාරිය සඳහා සහ වෙනුවෙන් එම ඉඩමෙහි සන්තකය ඔහු වෙත භාර දෙන ලෙස පිස්කල්ට විධාන කෙරෙන්නා වූ ආඥාවක් ඒ අධිකරණයෙන් ලබාගැනීමට ඔහුට හිමිකම තිබිය යුතු ය.

(6) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් (5) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් පිස්කල් වෙත නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් නොපමාව ම ඒ ආඥාව ක්‍රියාවේ යෙදවිය යුතු අතර, ඒ ආඥාව ක්‍රියාවේ යෙදවූ ආකාරය, ඒ අධිකරණය වෙත ලියවිල්ලකින් වාර්තා කළ යුතු ය.

(7) (5) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නිකුත් කරන ලද ආඥාවක් ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා ඒ ආඥාව අදාළ වන ඉඩමට ඇතුළුවීමට ද බාධා හෝ අවහිර පමුණු වන යම් තැනැත්තකු ඉවත් කිරීමට ද අධිකාරිය සඳහා සහ වෙනුවෙන් සන්තකය භාර ගැනීමට යථා පරිදි බලය පවරනු ලැබ සිටින තැනැත්තා වෙත ඉඩමෙහි සන්තකය භාර දීමට ද අවශ්‍ය බලය පිස්කල් විසින් හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ පාවිච්චි කරනු ලැබිය යුතු ය.

24 වන වගන්තිය යටතේ සන්තකය ඇරීමේ ප්‍රතිඵලය.

25. (1) 24 වන වගන්තිය යටතේ අධිකාරිය සන්තකය ලබා ගන්නා ලද්දේ යම් ඉඩමක ද, එම ඉඩම, එම සන්තකය ආරම්භ වන දිනයෙහි සිට සියලු බැඳීම්වලින් තොරව සම්පූර්ණයෙන් ම අධිකාරිය සතුවිය යුතු ය.

(2) 24 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් සන්තකයට ගෙන ඇත්තේ යම් ඉඩමක් ද, ඒ ඉඩමට හෝ ඉඩම සම්බන්ධයෙන් යම් අයිතිවාසිකමකට, හිමිකමකට, නැතහොත් සම්බන්ධතාවකට හිමිකම් පාන කිසිම තැනැත්තකුට ඒ ඉඩම සම්බන්ධයෙන් හෝ අධිකාරිය විසින් එහි සන්තකය ලබා ගැනීම සම්බන්ධයෙන් හෝ අධිකාරිය විසින් නැතහොත් අධිකාරිය යටතේ ඒ ඉඩම මත යම් වැඩක් කිරීම සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව මේ වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි හැර යම් සිවිල් නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් පැවරීමේ හිමිකම නොතිබිය යුතු ය.

(3) 24 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් සන්තකයට ගෙන ඇත්තේ යම් ඉඩමක් ද, ඒ ඉඩමට හෝ ඉඩම සම්බන්ධයෙන් (1) වන උපවගන්තියෙහි විධිවිධාන නිසා නොවේ නම්, යම් අයිතිවාසිකමක්, හිමිකමක් නැතහොත් සම්බන්ධතාවක් දරන යම් තැනැත්තකු විසින්, එම අයිතිවාසිකම, හිමිකම නැතහොත් සම්බන්ධතාව ප්‍රකාශ කරනු ලැබීම පිණිස ද, ඒ ඉඩම වෙනුවෙන් අධිකාරියෙන් වන්දි ලබා ගැනීම සඳහා ද නිසි අධිකරණ බලය ඇති අධිකරණයක අධිකාරියට විරුද්ධව නඩුවක් පවරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ නඩුවක දී යම් තැනැත්තකු වෙත ප්‍රදානය කරනු ලැබිය යුතු වන්දි ප්‍රමාණය, (5) වන උපවගන්තියෙහි වෙනත් විධිවිධාන සලසා ඇති පරිදි හැර, වන්දි මුදල් ප්‍රදානය කරනු ලබන්නේ යම් ඉඩමක් වෙනුවෙන් ද ඒ ඉඩම ඉඩම අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගන්නා ලද නම් ඉඩම අත්කර ගැනීමේ පනත යටතේ තීරණය කරනු ලැබිය හැකි වන්දි මුදල පදනම් කරගෙන, නිරණය කරනු ලැබිය යුතු ය.

(5) යම් ඉඩමක් පිහිටා ඇත්තේ යම් විශේෂ ප්‍රදේශයක් ඇතුළත ද ඒ විශේෂ ප්‍රදේශය සම්බන්ධයෙන් 4 (1) වන වගන්තිය යටතේ වූ නියමය කරන ලද දිනයෙන් ආරම්භ වන අවුරුදු තුනක කාලසීමාව ඇතුළත යම් අවස්ථාවක දී අධිකාරිය විසින් සන්තකයට ගන්නා ලද යම් ඉඩමක් වෙනුවෙන් (3) වන උපවගන්තිය යටතේ වූ නඩුවක දී යම් තැනැත්තකු වෙත වන්දි ගෙවීමට ඇති අවස්ථාවක, එම වන්දියෙහි ප්‍රමාණය තීරණය කිරීමේ කාර්යය සඳහා 23 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල විධිවිධාන අදාළ විය යුතු ය.

## මුදල්

26. අධිකාරියේ පොදු මුදල් කාර්යයන් සඳහා පිහිටුවනා ලද අරමුදලක් තිබිය යුතු ය. එම අරමුදලට— | අධිකාරියේ මුදල් සහ ගෙවීම අරමුදලට බැර කළ යුතු බව.

(අ) අධිකාරියේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සැලකෙන නියෝග හෝ රීති යටතේ නැතහොත් මේ පනතින් හෝ මේ පනත යටතේ පිරිනැමී ඇති බලතල කිසිවක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා අධිකාරිය විසින් අයකර ලබා ගන්නා ලද සියලු වරිපනම්, බදු, තීරු බදු, ගාස්තු, අය කිරීම් හා දණ්ඩන මුදල්;

(ඇ) අධිකාරිය වෙත සතු කරනු ලැබ ඇති හෝ අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන හෝ යම් දේපළකින් අධිකාරියට ව්‍යුත්පන්න වන සියලු ආදායම්;

(ඈ) අධිකාරිය විසින් සලසනු ලබන සේවයන් වෙනුවෙන් අධිකාරියට ව්‍යුත්පන්න වන සියලු ආදායම්;

(ඉ) අධිකාරිය වෙත දෙනු ලබන සියලු පරිත්‍යාග හෝ ප්‍රදාන; සහ

(ඊ) අධිකාරියේ බැරට උපචිත වන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

27. (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම, අධිකාරියේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම, අධිකාරියේ අධ්‍යක්ෂවරයන්ට හා සේවා නියුක්තයන්ට, පාරිශ්‍රමික ගෙවීම සහ මේ පනත යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය කිරීම සම්බන්ධයෙන් දරන ලද වියදම් පියවීමේ කාර්ය සඳහා අධිකාරිය විසින් සහ කලින් කල අනුමත කරනු ලබන වෙනත් කාර්යයන් සඳහා අධිකාරිය විසින් අධිකාරියේ අරමුදල් ප්‍රයෝජනයට ගත හැකි ය. | අරමුදලින් කරන ගෙවීම.

(2) අරමුදලින් මුදල් කිසිවක් ආපසු ගැනීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය යුතු අතර ඒ රීතිවලට අනුකූලව මිස, කිසිම මුදලක් අරමුදලින් ආපසු නොගත යුතු ය.

28. වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද— | ඇතැම් කර්තව්‍යයන් කරන ලෙස රජයේ සංස්ථා ආදියට නියම කිරීමට අධිකාරියට ඇති බලය.

(1) අධිකාරිය විසින්, එහි කර්තව්‍යයන් කිසිවක් කරගෙන යෑමේ කාර්යය සඳහා අදාළ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව යම් රජයේ සංස්ථාවකට හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට හෝ මේ පනත යටතේ පිහිටුවන ලද යම් සංස්ථාවකට මුදල් වෙන් කරනු ලැබිය හැකි අතර එකී කර්තව්‍යයන් කරගෙන යෑම සහ ඒ කර්තව්‍යය පිළිබඳ වියදම් සඳහා යථා පරිදි විස්තර සැපයීම, අවස්ථාවෝචිත පරිදි, ඒ සංස්ථාවේ හෝ දෙපාර්තමේන්තුවේ කාර්යය විය යුතු ය;

(2) ඒ මුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් අධිකාරියට අවශ්‍ය විය හැකි යම් තොරතුරු සැපයිය යුතු යයි, අවස්ථාවෝචිත පරිදි, යම් සංස්ථාවකට හෝ දෙපාර්තමේන්තුවකට නියම කිරීමේ හිමිකම අධිකාරියට තිබිය යුතු අතර ඒ නියමයට අනුකූලව ක්‍රියාකිරීම ඒ සංස්ථාවේ හෝ දෙපාර්තමේන්තුවේ කාර්යය විය යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය.

29. අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

බදු යනාදිය ගෙවීමෙන් අධිකාරිය නිදහස් කිරීම.

30. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද—

(අ) අධිකාරිය විසින් ආනයනය කරන ලද හෝ බන්ධනයෙන් පිටත මිලට ගන්නා ලද යම් වර්ගයක සියලු භාණ්ඩ රේගු බද්දෙන් නිදහස් විය යුතු ය;

(ආ) අධිකාරිය විසින් හෝ වෙනුවෙන් හෝ අධිකාරියේ වාසියට හෝ ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් මුද්දර බද්ද ගෙවීමෙන්, මෙම නිදහස් කිරීම නිසා නොවේ නම් එම සාධන පත්‍රය වෙනුවෙන් අය කරනු ලබන බද්ද ගෙවීමට අධිකාරිය යටත් වන අවස්ථාවල දී, අධිකාරිය නිදහස් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම නිදහස් කිරීම අධිකාරිය යටතේ වූ යම් සංස්ථාවකට හෝ පාලිත ආයතනයකට අදාළ නොවිය යුතු ය.

අනුමත පාලිත ආයතන සහ එකී ආයෝජන ඇතැම් බදුවලින් නිදහස් කිරීම.

31. (1) "අනුමත පාලිත ආයතනය" යන්නෙන්, යම් විශේෂ ප්‍රදේශයක ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නා වූ ද අනුමත පාලිත ආයතනයක් විය යුතු යයි ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක් මගින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලබන්නා වූ ද, අධිකාරියේ පාලිත ආයතනයක හෝ මේ පනත යටතේ පිහිටුවන ලද සංස්ථාවක පාලිත ආයතනයක් හෝ අදහස් වේ.

(2) "අනුමත ආයෝජනය" යන්නෙන්, පළමුවරට නිකුත් කරනු ලැබූ කොටස් නොවන කොටස් මිල දී ගැනීමේ කාර්යය සඳහා වූ ආයෝජනයක් නොවන, යම් අනුමත පාලිත ආයතනයක සාමාන්‍ය කොටස් මිල දී ගැනීමේ කාර්යය සඳහා වූ ආයෝජනයක් අදහස් වේ.

(3) යම් තක්සේරු වර්ෂයක දී, අනුමත ආයෝජනයක් කරනු ලැබූ යම් තැනැත්තකුට එම තැනැත්තා විසින් එම තක්සේරු වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු බද්ද එම තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායමෙන් අනුමත ආයෝජනයෙහි මුදල අඩු කරනු ලැබුවේ නම්, බද්ද ලෙස ගෙවිය යුතු වන මුදලෙහි ප්‍රමාණයට අඩුවීම නිසැකවන පරිදි එම ආයෝජනය සම්බන්ධයෙන් එකී තක්සේරු වර්ෂය සඳහා සහතිකයක් ලබාගැනීමට හිමිකමක් තිබිය යුතු ය.

(4) ආයෝජනය කරන ලද දිනයට ඉක්බිතිව එළඹෙන තක්සේරු වර්ෂ පහ වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු වන ධන බද්ද ආගණනය කිරීමේ කාර්යය සඳහා එම තැනැත්තාගේ ධනයෙහි අනුමත ආයෝජනයෙහි මුදල අත්හැරිය යුතු ය.

(5) යම් අනුමත පාලිත ආයතනයක ආදායම, එම පාලිත ආයතනය කටයුතු ආරම්භ කළ දිනයෙන් ඉක්බිතිව එළඹෙන තක්සේරු වර්ෂ පහ අතුරින් එක් එක් තක්සේරු වර්ෂය සඳහා යම් ආදායම් බද්දකින් නිදහස් කරනු ලැබිය යුතු ය.

(6) යම් අනුමත පාලිත ආයතනයක කොටස්කරුවකුට යම් වර්ෂයක දී ගෙවන ලද යම් ලාභාංශයක් එම අනුමත පාලිත ආයතනය ව්‍යාපාරික කටයුතු ආරම්භ කළ දිනයෙන් ඉක්බිතිව එළඹෙන තක්සේරු වර්ෂ පහ අතුරින් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

විශේෂඥයන් ආදීන්ගේ සංවේතන බදු ආදියෙන් නිදහස් විය යුතු බව.

32. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නොවන්නා වූ ද අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව අධිකාරිය විසින් හෝ සංස්ථාවක් විසින් හෝ යම් අනුමත පාලිත ආයතනයක් විසින් හෝ සේවයෙහි නියුක්ත කරගනු ලැබුවා වූ ද යම් විද්‍යාඥයකුගේ, කාර්මික ශිල්පියකුගේ, විශේෂඥයකුගේ, උපදේශකයකුගේ හෝ වෙන යම් තැනැත්තකුගේ සංවේතන—

(i) ශ්‍රී ලංකාවේ යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ දැනට පනවනු ලැබ ඇත්තා වූ හෝ මින් මතු පනවනු ලබන්නා වූ බදු, තීරු බදු හෝ ගාස්තු කිසිවක් සඳහා වූ අඩුකිරීමක් නොමැතිව සහ ඒ බදුවලින්, තීරු බදුවලින් හෝ ගාස්තුවලින් තොරව ; සහ

(ii) ශ්‍රී ලංකාවේ යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ දැනට පනවනු ලැබ ඇත්තා වූ හෝ මින් මතු පනවනු ලබන්නා වූ සියලු සීමාකිරීම්වලින් තොරව

ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියේ ණය ගැනීම් සහ ආණ්ඩුවේ ඇපවීම්.

33. (1) ජනාධිපතිවරයා විසින් අනුමත කරන ලද යම් දේශීය, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින් අධිකාරිය විසින් ලබා ගනු ලබන ණය සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි මත ඇපවීමට ආණ්ඩුවට මෙයින් බලය දෙනු ලැබේ. ඇපවීමට මේ උපවගන්තිය යටතේ බලය දෙනු ලබන්නේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය ලබන විදේශීය ව්‍යවහාර මුදලින් සම අගය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන යම් ඇපවීමක් මත ආණ්ඩුව විසින් ගෙවිය යුතු සියලු මුදල් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට මෙයින් වැය බර කරනු ලැබේ.

(3) ජනාධිපතිවරයා විසින් අනුමත කරනු ලද යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින් දෙන ලද යම් ණයක මුල් මුදල, පොලිය හෝ වෙනත් අයකිරීම් සම්බන්ධයෙන් අධිකාරිය විසින් ගෙවිය යුතු හෝ ඒ ණය සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ඇපවීමක් යටතේ ආණ්ඩුව විසින් ගෙවිය යුතු හෝ සියලු මුදල් ශ්‍රී ලංකාවේ වෙනත් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද,—

(i) ශ්‍රී ලංකාවේ යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ දැනට පනවනු ලැබ ඇත්තා වූ හෝ මින් මතු පනවනු ලබන්නා වූ බදු, තීරු බදු හෝ ගාස්තු කිසිවක් සඳහා වූ අඩුකිරීමක් නොමැතිව සහ ඒ බදුවලින්, තීරුබදු වලින් හෝ ගාස්තුවලින් තොරව ; සහ

(ii) ශ්‍රී ලංකාවේ යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ දැනට පනවනු ලැබ ඇත්තා වූ හෝ මින් මතු පනවනු ලබන්නා වූ සියලු සීමාකිරීම්වලින් තොරව

ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද යම් බැඳුම්කරයක් හෝ පොරොන්දු පත්‍රයක් ශ්‍රී ලංකාවෙහි වාසික තැනැත්තකුගේ ප්‍රතිලාභය පිණිස එම තැනැත්තාට අයිතිව තිබෙන විට ඒ බැඳුම්කරය හෝ පොරොන්දු පත්‍රය යටතේ යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් නොවන, ඒ බැඳුම්කරයේ හෝ පොරොන්දු පත්‍රයේ ධාරකයාට කරනු ලබන ගෙවීම් පිළිබඳ වූ බදු, තීරු බදු, ගාස්තු හෝ සීමාකිරීම් කිසිවකට මේ උපවගන්තියේ ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කාර්යයන් සඳහා යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙහි නේවාසිකයකු ද නැද්ද යන ප්‍රශ්නය 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව තීරණය කළ යුතු ය.

(5) මේ පනත අනුව ආණ්ඩුව සහ යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් අතර වූ සෑම ඇප ගිවිසුමක් සහ එයින් යම් ඇප ගිවිසුමක් අනුව ආණ්ඩුව විසින් කරනු ලබන සෑම ඇපවීමක් ම, ශ්‍රී ලංකාවේ යම් නීතියක පටහැණිව කුමක් සඳහන්ව ඇත ද ඒ ඇප ගිවිසුම්වල නියමයන්ට අනුකූලව වලංගු සහ බලාත්මක විය යුතු ය.

(6) ජනාධිපතිවරයා විසින් අනුමත කරන ලද යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් විසින් අධිකාරියට දෙන ලද යම් ආණ්ඩුව ඇපවුණු යම් ණයක් සම්බන්ධයෙන් වූ විට එම ණය මුදල ප්‍රකාශ කරනු ලැබූ ව්‍යවහාර මුදලට නැතහොත් ව්‍යවහාර මුදල්වලට අදාළව රුපියලෙහි යම් ප්‍රතිප්‍රමාණ කිරීමක හේතුවෙන් ඇතිවන යම් පාඩුවක් ආණ්ඩුව විසින් දැරිය යුතු අතර ඒ හේතුවෙන් ඇතිවන යම් ලාභයක හිමිකම ආණ්ඩුවට තිබිය යුතු ය. තවද ඒ සෑම පාඩුවක් ම ඒකාබද්ධ අරමුදලට මෙයින් වැය බර කරනු ලැබේ.

(7) ජනාධිපතිවරයා වෙත හෝ ඔහුගේ අත්සන යටතේ වූ සාධන පත්‍රයකින් ජනාධිපතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ යම් තැනැත්තකු වෙත, ආණ්ඩුව සහ යම් දේශීය, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් අතර වූ යම් ගිවිසුමක් ආණ්ඩුව වෙනුවෙන් අත්සන් කිරීමට, මෙයින් බලය දෙනු ලැබේ.

(8) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, ජනාධිපතිවරයා විසින් අනුමත කරන ලද යම් දේශීය, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින් අධිකාරිය විසින් ලබාගනු ලබන යම් ණයක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් ලියා අත්සන් කරනු ලබන කිසිම ගිවිසුමක්, බැඳුම්කරයක් හෝ වෙනත් ලේඛනයක් යම් මුද්දර ගාස්තුවකට හෝ කවර වූ හෝ අය බද්දකට යටත් නොවිය යුතු ය; නැතහොත් එවැනි ගිවිසුමක්, බැඳුම්කරයක් හෝ වෙනත් ලේඛනයක් සම්බන්ධයෙන් යම් මුද්දර ගාස්තුවක් හෝ කවර වූ හෝ බද්දක් අය නොකළ යුතු ය.

34. අධිකාරියේ ගිණුම් අධිකාරිය විසින් නිරණය කරනු ලබන ආකෘතියක හා ආකාරයකට තැබීමට අධිකාරිය විසින් සලස්වනු ලැබිය යුතු ය. අධිකාරියේ ගිණුම්.

## සංස්ථා පිහිටුවීම

35. (1) යම් විශේෂ ප්‍රදේශයක හෝ විශේෂ ප්‍රදේශ වැඩි ගණනක නැතහොත් විශේෂ ප්‍රදේශයක යම් කොටසක හෝ එය සම්බන්ධයෙන්, අධිකාරියේ යම් කර්තව්‍යයක් හෝ කර්තව්‍ය ගණනක් නැතහොත් ඉන් යම් කොටසක් කිරීමේ කාර්යය සඳහා සංස්ථාවක් පිහිටුවීම යෝග්‍ය යයි අධිකාරිය විමසීමෙන් පසුව අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ගැසට් පත්‍රයේ පළකරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාගත කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්— සංස්ථා පිහිටුවීම සඳහා සංස්ථාගත කිරීමේ නියම.

(අ) එම නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කර්තව්‍යයන් කිරීම සඳහා සංස්ථාවක් පිහිටුවිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය හැකි ය;

(ආ) එම නියමය අදාළ ප්‍රදේශය නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය;

(ඇ) සංස්ථාවට සංස්ථා නාමයක් නියම කරනු ලැබිය හැකි ය;

(ඈ) සංස්ථාවේ ආරම්භක කොටස් ප්‍රාග්ධනය නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අතර අධිකාරිය විසින් ගෙවිය යුතු යම් කොටස් ප්‍රාග්ධනයක් වේනොත් එහි මුදල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය; තව ද

(ඉ) අධිකාරියේ බලතල අතුරින් කිසිවක්, සංස්ථාවේ විශේෂ බලයක් වශයෙන් නිශ්චිතවූ සඳහන් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ කල්හි, ඒ නියමයේ සඳහන් සංස්ථානාමය සහිත වූ (මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාව සංස්ථාගත මණ්ඩලයක් විය යුතු බව.

36. (1) සංස්ථාවට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද එහි සංස්ථා නාමයෙන් සංස්ථාව විසින් නඩු පැවරීම ද සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය. සංස්ථා විසින් නීතියට අනුව ඉටු කරනු ලැබිය හැකි ක්‍රියා කිසිවක් සංස්ථාව විසින් ඉටු කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ පිහිටුවන ලද යම් සංස්ථාවක් සම්බන්ධයෙන්, මේ පනතේ 11 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

සංස්ථාවේ කර්තව්‍ය.

37. සංස්ථාවේ කර්තව්‍යයන් සංස්ථාගත කිරීමේ නියමයෙහි නිශ්චිතව සඳහන් කර්තව්‍යයන් සහ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් කර්තව්‍යයන් විය යුතු ය.

සංස්ථාවේ බලතල.

38. (1) ස්වකීය කර්තව්‍යයන් ඉටුකිරීමෙහි ලා අවශ්‍ය විය හැකි වූ හෝ හිතකර විය හැකි වූ හෝ ආනුෂංගික විය හැකි වූ සියලු ක්‍රියා කිරීමේ ද සියලු පියවර ගැනීමේ ද බලය සංස්ථාවට තිබිය යුතු ය.

(2) සංස්ථාව වෙත පිරිනැමුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, සංස්ථාගත කිරීමේ නියමයේ සඳහන් විශේෂ බලතල සංස්ථාවට තිබිය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලය.

39. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂවරයන් සත් දෙනකුගෙන් සමන්විත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයක් විය යුතු ය.

(2) ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාවකින් සහ යම් කොටස්කාර අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාවකින් මණ්ඩලය සමන්විත විය යුතු ය.

ආණ්ඩුවේ අධ්‍යක්ෂවරු.

40. (1) එක් එක් ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයා මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කරතහොත් මිස, ඔහු අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය:

එසේ වුව ද, ධුරයෙන් ඉවත් කරනු ලැබූ හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කළ හෝ ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයකු වෙනුවට පත් කරනු ලැබූ ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයකු ඔහු කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස්කළහොත් මිස, ඔහු අනුප්‍රාප්තවන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(2) එසේ කිරීම සුදුසු යයි අමාත්‍යවරයා සිතතහොත් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් යම් ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයකු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් යම් ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කිරීම, යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන්, යම් ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයකුට ඕනෑම අවස්ථාවක දී මණ්ඩලයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(4) රෝගාතුරවීම, දුබලතාව හෝ වෙනත් යම් හේතුවක් නිසා ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයකුට, ඔහුගේ ධුරයේ කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, එම ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙන යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(5) ධුරයෙන් ඉවත් කරනු ලැබූ ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයකු, අධ්‍යක්ෂවරයකු ලෙස නැවත පත් කරනු ලැබීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් මණ්ඩලයට සේවය කිරීම සඳහා හෝ සුදුසු නොවිය යුතු ය.

අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයන්ට විශේෂ හෝ සාමාන්‍ය විධාන නිකුත් කළ හැකි බව.

**41.** ස්වකීය කර්තව්‍යයන් කිරීමේ දී සහ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයකුට, අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසීමෙන් පසුව සාමාන්‍ය හෝ විශේෂ විධාන කිසිවක් කරනු ලැබිය හැකි අතර, එම ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයා විසින් ඒ සෑම විධානයක් ම ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ ප්‍රාග්ධනය.

42. (1) සංස්ථාවේ ප්‍රාග්ධනය සංස්ථාගත කිරීමේ නියමයෙහි නිශ්චිතව සඳහන් ප්‍රාග්ධනය විය යුතු අතර කොටස්කරුවන් විසින් ඒ ප්‍රාග්ධනය කොටසක් රුපියල් සියය බැගින් වූ සාමාන්‍ය කොටස්වලට බෙදනු ලැබිය යුතු ය :

එසේ වුව ද කොටස්කරුවන් විසින් විශේෂ යෝජනා සම්මුතියක් මගින් එම ප්‍රාග්ධනය වැඩි කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සංස්ථාගත කිරීමේ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි, අධිකාරිය විසින් ඒ ප්‍රාග්ධනයට දායක විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කොටස් වෙන්කර දීම, ඒ කොටස් තෝරාගැනීමේ බලය ප්‍රදානය කිරීම හෝ ඒවා සුදුසු පරිදි අන්‍යාකාරයකින් බැහැර කිරීම, මණ්ඩලය විසින් (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඔවුන් සුදුසු යයි සිතන යම් තැනැත්තන් වෙත එසේ සිතන යම් නියම හා කොන්දේසි මත එසේ සුදුසු යයි සිතන යම් වේලාවන්වල දී කරනු ලැබිය හැකි ය. එහෙත් කිසිම කොටසක් වට්ටමකට නිකුත් කරනු නොලැබිය යුතු ය.

කොටස් කරුවන්ගේ බැඳීම.

43. යම් කොටස්කරුවකුගේ බැඳීම, ඒ කොටස්කරුවාගේ කොටස් සම්බන්ධයෙන් නොගෙවූ මුදලක් වෙතොත් එම මුදලට සීමා විය යුතු ය.

කොටස් කාර අධ්‍යක්ෂ වරයා.

44. සංස්ථාවේ, තත්කාලයේ කොටස්කරුවන් විසින් කොටස්කාර අධ්‍යක්ෂවරයකු තෝරාපත් කරගනු ලැබිය යුතු අතර ඒ සඳහා සංස්ථාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ඔහු ධුරය දැරිය යුතු ය.

සංස්ථාවේ සභාපති.

45. (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අධ්‍යක්ෂවරුන් අතුරෙන් යම් අධ්‍යක්ෂවරයකු සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් තෝරා පත් කරගනු ලැබිය හැකි ය.

(2) සභාපතිවරයා මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා පැමිණ නොමැති විටෙක පැමිණ සිටින අධ්‍යක්ෂවරුන් විසින් තෝරාපත් කරගනු ලබන අධ්‍යක්ෂවරයකු ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ වරයා.

46. අධ්‍යක්ෂවරයන් අතුරෙන් යම් අධ්‍යක්ෂවරයකු සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් මණ්ඩලය විසින් තෝරා පත්කර ගනු ලැබිය හැකි ය.

අධිකාරිය තනි කොටස් කරු නොවන අවස්ථාවක සංස්ථාවට අදාළ විය යුතු විධිවිධාන.

47. අධිකාරිය සංස්ථාවක තනි කොටස්කරු නොවන අවස්ථාවක—

(1) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන සලස්වා නොමැත්තා වූ යම් කාරණාවක් සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධානවලට යටත්ව සමාගම් ආඥාපනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම සංස්ථාවට අදාළ විය යුතු ය.

(2) මේ පනතින් විධිවිධාන සලස්වා නොමැති කාරණා, ඒ කාරණා සමාගම් ආඥාපනත යටතේ පිහිටුවන ලද සමාගමක් සම්බන්ධයෙන් වූ විට එහි සාංගමික ව්‍යවස්ථාවලියෙන් විධිවිධාන සලස්වනු ලබන කාරණා වන විට, ඒ කාරණා අල්ලා අතුරු ව්‍යවස්ථා සෑදීම ඒ සංස්ථාවේ මණ්ඩලය විසින් කළ හැකි ය.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් (2) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යෝජනා සම්මතයෙහි නිශ්චිත ව සඳහන් ආකාරයට සංශෝධනය කරන ලෙස, අන්‍යාකාර කරන ලෙස, වෙනස් කරන ලෙස හෝ පරිච්ඡින්න කරන ලෙස කොටස්කරුවන් විසින්, විශේෂ යෝජනා සම්මුතියක් මගින් මණ්ඩලයට විධාන කළ හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධානය ක්‍රියාත්මක කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා, එම අතුරු ව්‍යවස්ථා අදාළ වන කාරණා සම්බන්ධයෙන් සංස්ථාවේ රීති විය යුතු අතර එයින් සංස්ථාවේ අධ්‍යක්ෂවරුන්, කොටස්කරුවන් හා කාර්ය මණ්ඩලය බැඳී සිටිය යුතු ය.

(5) මණ්ඩලය විසින් සාදනු ලැබ තත් කාලයෙහි බලපවත්නා අතුරු ව්‍යවස්ථා ඇවෙක්ෂණය කිරීමට මණ්ඩලය විසින් යම් තැනැත්තකුට ඉඩ සැලැස්විය යුතු ය.

48. (1) සංස්ථාවක්, සමාගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබීම අවශ්‍ය නොවිය යුතු අතර, සංස්ථාව සම්බන්ධයෙන් යම් බලයක් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට නොතිබිය යුතු ය.

ඇතැම් ප්‍රඥප්ති සංස්ථාවට අදාළ කිරීම.

(2) සංස්ථාවක් හෝ යම් අනුමත පාලිත ආයතනයක් සම්බන්ධයෙන් 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත අදාළ නොවිය යුතු ය.

49. (1) සංස්ථාවේ කොටස්කරුවන් විසින් වාර්ෂිකව පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයන් දෙදෙනකු විසින් සංස්ථාවේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය.

ගිණුම විගණනය කිරීම.

(2) කොටස්කරුවන් විසින් සංස්ථාවේ විගණකවරයන්ගේ පාරිශ්‍රමිකය නිරණය කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ එක් එක් විගණකවරයාට සංස්ථාවේ වාර්ෂික ශේෂ පත්‍රයෙහි පිටපතක් සැපයිය යුතු අතර එයට අදාළ ගිණුම් සහ වවුචර සමග එම ශේෂ පත්‍රය පරීක්ෂා කිරීම එම විගණකවරයාගේ කාර්යය විය යුතු ය. ඔහුට සියලු සාධාරණ වේලාවල දී සංස්ථාවේ පොත්, ගිණුම් සහ වවුචර බැලීමට ඉඩ තිබිය යුතු අතර ස්වකීය කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු හා පැහැදිලි කිරීම ලබා ගැනීමට සංස්ථාවේ අධ්‍යක්ෂවරුන්ගෙන් සහ නිලධරයන්ගෙන් ඉල්ලා සිටීමේ හිමිකම තිබිය යුතු ය.

(4) සංස්ථාවේ එක් එක් විගණකවරයා විසින් සංස්ථාවේ වාර්ෂික ශේෂ පත්‍රය සහ ගිණුම් සම්බන්ධයෙන් ලිඛිත වාර්තාවක් පිළියෙල කළ යුතු අතර තමා විසින් ඉල්ලා සිටින ලද සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් ලැබුණේ ද නැද්ද යන වගත් තමාගේ මතය අනුව, තමා වෙත සපයන ලද උපරිම තොරතුරුවලට හා පැහැදිලි කිරීම්වලට අනුව සහ සංස්ථාවේ පොත්වල දක්වෙන පරිදි එම ගිණුම් තමාගේ මතයට අනුව සංස්ථාවේ කටයුතු පිළිබඳ සත්‍ය හා නිවැරදි දර්ශකයක් පිළිබිඹු වන පරිදි නියියාකාරව පිළියෙල කර තිබෙන්නේ ද යන වගත් එම වාර්තාවෙහි සඳහන් කළ යුතු ය.

(5) සංස්ථාවේ එක් එක් විගණකවරයාගේ වාර්තාව ඒ විගණකවරයා විසින් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

50. (1) අතුරු ව්‍යවස්ථා සෑදීමට මේ පනත මගින් කියමි කර ඇත්තේ නැතහොත් බලය පවරා ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා සම්බන්ධයෙන් සංස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය.

අතුරු ව්‍යවස්ථා සෑදීමට සංස්ථාවට ඇති බලය.

(2) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම අතුරු ව්‍යවස්ථාවක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ එහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

මේ පනතේ ඇතැම් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම සහිතව සංස්ථාවකට අදාළ විය යුතු බව.

51. මේ පනතේ 7 වන, 8 වන, 10 වන, 11 වන, 14 වන, 15 වන, 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන, 26 වන, 28 වන, 29 වන සහ 32 වන වගන්තිවල විධිවිධාන මේ පනත යටතේ පිහිටුවන ලද යම් සංස්ථාවකට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

## විවිධ කරුණු

කටයුතු සම්බන්ධයෙන් විමර්ශනය කරන ලෙස නියම කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

52. තමා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් අධිකාරියේ කටයුතු සියල්ල හෝ ඉන් කිසිවක් විමර්ශනය කර, වාර්තා කළ යුතු ය යි අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි අතර ඒ නියමය කරනු ලැබූ විට එම නියමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු පහසුකම් අධිකාරිය විසින් සැලසිය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන.

53. (1) අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසීමෙන් පසුව, අධිකාරියේ කාර්යයන් ඉටු කිරීමෙහි හා බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සාමාන්‍ය හෝ විශේෂ විධාන අධිකාරියට ලියවිල්ලකින් දෙනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් එම විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(2) අධිකාරියේ දේපළ සහ ගනුදෙනු සම්බන්ධයෙන් තමාට අවශ්‍ය ආකාරයේ වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල ලියවිල්ලක් මගින් අධිකාරියට විධාන කරනු ලැබිය හැකි අතර අධිකාරිය විසින් ඒ සෑම විධානයක් ම ක්‍රියාත්මක කළ යුතු ය.

නියෝග.

54. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසීමෙන් පසුව නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයේ සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය. තව ද එය මෙහි ලා පනවන ලද්දක් මෙන් වලංගු සහ බලසහිත විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

55. (1) රීති සෑදීමට නියම කර ඇත්තේ නැතහොත් බලය පවරා ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති.

(2) අධිකාරිය විසින් සාදන ලද සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ එහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

56. අධිකාරිය සහ මේ පනත යටතේ පිහිටුවන ලද සෑම සංස්ථාවක් ම අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතන ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය. අධිකාරිය සහ සංස්ථාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතන විය යුතු බව.

57. අධිකාරියෙහි සහ මේ පනත යටතේ පිහිටුවන ලද සෑම සංස්ථාවක ම, සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

58. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, යම් විශේෂ ප්‍රදේශයක් තුළ කිසිම පළාත් පාලන ආයතනයක් අමාත්‍ය වරයාගේ එකඟත්වය නොමැතිව සංස්ථාපනය කරනු නොලැබිය යුතු ය. අමාත්‍ය වරයාගේ එකඟත්වය නොමැතිව පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය නොකළ යුතු බව.

59. (1) (අ) මේ පනත යටතේ අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සඳහා අධිකාරියට විරුද්ධව ; හෝ මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

(ආ) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට හෝ අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සඳහා ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියට පමුණුවනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ මුදල්වලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවූ හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද හෝ ගාස්තු කිසිවක් අධිකාරියේ මුදල්වලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට හෝ තමා විසින් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියට පමුණුවනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි

සඳහන් යම් තැනැත්තකු විසින් දරන ලද වියදමක් එම වියදම එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් ආපසු අයකර ගනු ලබන්නේ නම් මිස, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, අධිකාරියේ මුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

60. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"වෙනත් යම් ලිඛිත නීතියක්" යන්නෙන්, පනවා තිබෙන හෝ පනවනු ලබන, මේ පනත නොවන යම් ලිඛිත නීතියක් අදහස් වේ;

"අධිකාරිය" යන්නෙන්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අදහස් වේ;

"ශ්‍රී ලංකාවේ පුරවැසියා" යන්න—

(අ) පුද්ගලයකු වන තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන කල්හි, එම පුරවැසිභාවයට අදාල ව තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන පුද්ගලයෙක් එයින් අදහස් වේ;

(ආ) සමාගමක් වන තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන කල්හි, සමාගම් ආඥාපනතේ XI වන කොටස අදාල නොවන සමාගමක් එයින් අදහස් වේ; තව ද

(ඇ) තැනැත්තන් දෙදෙනකුට වැඩි ගණනකින් සමන්විත ව්‍යාපාරික ආයතනයක් වන තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන කල්හි, හවුල්කරුවන්ගෙන් වැඩි දෙනෙක් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන ව්‍යාපාරික ආයතනයක් එයින් අදහස් වේ;

"සංස්ථාව" යන්නෙන්, මේ පනත යටතේ පිහිටුවන ලද සංස්ථාවක් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහ නගර සභාවක්, නගර සභාවක්, සුළුනගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ;

"තැනැත්තා" යන්නට සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද

ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැත හොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

"සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීමට, එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද පුද්ගලයෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක් හෝ

අදහස් වේ ;

"විශේෂ යෝජනා සම්මතය" යන්නෙන්, කොටස්කරුවන්ගේ රැස්වීමක දී යෝජනා කිරීමට අදහස් කරන යෝජනා සම්මතය පිළිබඳව සඳහන් කර දවස් විසි එකකට නො අඩු දැනුම් දීමක් කොටස්කරුවන් වෙත යථා පරිදි කරනු ලැබූ ද යෝජනා සම්මතයක් කිරීමට හිමිකම් ඇති කොටස්කරුවන්ගේ රැස්වීමක දී පෞද්ගලිකව හෝ ප්‍රතිපුරුෂයකු මගින් හෝ ඡන්දය දෙන කොටස්කරුවන් ගෙන් හතරෙන් තුන් කොටසකට නො අඩු වැඩි ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කරනු ලැබූ ද යෝජනා සම්මතයක් අදහස් වේ ;

"පාලිත ආයතනය" යන්නෙන්, වගකීම සීමාසහිත වූ ද සමාගම් ආඥාපනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබුවා වූ ද අධිකාරිය විසින් හෝ මේ පනත යටතේ පිහිටුවන ලද සංස්ථාවක් විසින් අයත් කර ගනු ලැබූ සියයට දහයකට නො අඩු කොටස් ප්‍රාග්ධනයක් ඇත්තා වූ ද සමාගමක් අදහස් වේ.

### "අ" උපලේඛනය

1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද මහවැලි සංවර්ධන මණ්ඩලය.

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය.

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලය.

ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

මිනුම් දෙපාර්තමේන්තුව.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

## "ආ" උපලේඛනය

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය සංස්ථාගත කිරීමේ නියමය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික ඵලදාවර්ධන පනත.

1958 අංක 29 දරන සත්ව පනත.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත.

රජයේ ඉඩම් ආඥාපනත.

විනෝද බදු ආඥාපනත.

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂා ආඥාපනත.

ජලගැලීම් ආරක්ෂා ආඥාපනත.

කැලෑ ආඥාපනත.

වාරිමාර්ග ආඥාපනත.

ඉඩම් සංවර්ධන ආඥාපනත.

1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනත.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් සහ ඛනිජ ද්‍රව්‍ය පනත.

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත.

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත.

ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩල පනත.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත.

1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත.

මංමාවත් ආඥාපනත.

රේන්ද ආඥාපනත.

වාහන ආඥාපනත.

1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනත.

ළිං සහ වලවල් පිළිබඳ ආඥාපනත.

ඉහත කී ප්‍රඥප්ති කිසිවක් යටතේ පනවන ලද ලිඛිත නීති.